රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 15/2007(IV)

මගේ අංකය:EST-6/LOANS/04/1040
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2020.12.15

අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## රජයේ සේවකයන් සඳහා බැංකු මගින් දේපළ හා වාහන ණය ලබාදීම

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2007.06.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/2007, 2009.11.18 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/2007(I), 2014.12.26 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/2007(II) හා 2015.09.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/2007(III) කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/2007 ක්‍රියාත්මක වූ 2007.06.15 දින සිට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/2007, 15/2007(I), 15/2007(II) සහ 15/2007(III) හි විධිවිධානවලට යටත්ව මේ දක්වා ලබාගත් සහ ඉදිරියේ දී දෙනු ලබන දේපළ ණය සඳහා අය කළ යුතු පොළී අනුපාත 2021.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි පහත සඳහන් අයුරින් සංශෝධනය කරනු ලැබේ.

| ණය මුදල (රුපියල්) | නිලධරයා විසින් ගෙවිය යුතු පොළී ප්‍රතිශතය | රජය විසින් ගෙවිය යුතු පොළී ප්‍රතිශතය | බැංකුවට ගෙවිය යුතු මුළු පොළී ප්‍රතිශතය |
|---|---|---|---|
| දේපළ ණය | | | |
| 500,000 දක්වා | 3.0% | 5.5% | 8.5% |
| 500,001 සිට 1,000,000 දක්වා | 6.0% | 2.5% | 8.5% |
| 1,000,001 සිට 3,000,000 දක්වා | 7.0% | 2.0% | 9.0% |
| වාහන ණය | | | |
| වාහන ණය සඳහා පොළී අය කිරීම | පෙර පරිදි අයකළ යුතුය. | | |

03. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඇතිව නිකුත් කරනු ලැබේ.

ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය